



# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| (1) පුස්තකාල සේවක III ශ්‍රේණිය | (2) උද්‍යාන සේවක III ශ්‍රේණිය |
| (3) ක්‍රීඩා පිටි සේවක III ශ්‍රේණිය | (4) ආරක්ෂක නියාමක III ශ්‍රේණිය |
| (5) වැඩ සහායක III ශ්‍රේණිය | |

**සුදුසුකම් :** 1) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

**වෙනත් අවශ්‍යතා :**

සියළු අයදුම්කරුවන්;

1. ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
2. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතු ය.
3. මනා චරිතයකින් හෙබි පුද්ගලයන් විය යුතු ය.

**වැටුප් පරිමාණය :** රු. 42,775 - 10x450; 10x490; 10x540; 12x640 - 65,255 (මාසික)
(U-PL 1 – 2025)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) හි දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුව වැටුප ගෙවනු ලැබේ.)

(මෙයට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ද ගෙවනු ලැබේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල හා සේවා නියුක්තයින්ගේ භාර අරමුදල යන ඒවායේ අයකත්වය හිමි වේ.)

**බඳවාගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

මේ සඳහා වන අයදුම්පත් **www.wyb.ac.lk** යන වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි ය. එක් අයදුම්කරුවෙකු තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025 නොවැම්බර් මස 04 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන සේ නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු ය. අදාළ සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල සත්‍ය පිටපත් බවට සහතික කළ ඡායා පිටපත් පමණක් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු අතර අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු ය. අසම්පූර්ණ හෝ ඉහත සුදුසුකම් සපුරා නොමැති හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
2025-10-17 වන දින